51

# හින්දුස්තානි සංගීතයේ ස්වරයන්ගේ විකාසනය කෙරෙහි වෛදික ශාස්ත්‍රවල බලපෑම

*එන්. ඩබ්ලිව්. පී. වීරසිංහ* [1]
HS/2013/1133

හින්දුස්තානි සංගීත පද්ධතිය තුළ භාවිත ස්වරයන්ගේ විකාසනය සඳහා වෛදික ශාස්ත්‍රයන්ගෙන් ලැබුණු බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. හින්දුස්තානි සංගීත පද්ධතියේ ස්වරයන්ගේ විකාසනය සඳහා පසුබිම් වූ සාධක අතරින් ආගමික වත් පිළිවෙත් හා ඒවායේ වර්ධනය හේතු වූ බව පෙනේ. ඒ අනුව හින්දුස්තානි ස්වර සාධනයේ විකාසනය සඳහා භාරතීය ආගමික සංස්ථාවන් හේතු වූ බව තහවුරු කිරීම මෙම පර්යේෂණයේ දී අපේක්ෂා කෙරේ. මේ සඳහා සාමවේදය හා වෛදික ග්‍රන්ථ වැනි ප්‍රාථමික මූලාශ්‍ර මෙන් ම භාරතීය සංගීතය පිළිබඳ හා භාරතීය ඉතිහාසය පිළිබඳ විවිධ විද්වතුන් විසින් රචනා කර ඇති ග්‍රන්ථ ද උපයෝගී කර ගන්නා ලදී.

ප්‍රමුඛ පද : හින්දුස්තානි සංගීතය, ස්වර, වෛදික යුගය, වේද ග්‍රන්ථ

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) ප්‍රථම වසර* prabhawee@gmail.com